**අඩ්ඩාලචේන ප්‍රාදේශීය සභාව - 2023**

**-----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

අඩ්ඩාලචේන ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම , මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට අඩ්ඩාලචේන ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්‍ාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී පරිත්‍යාග ලෙස ලැබී තිබුණු පොත් 1,111 ක වටිනාකම රු.255,995 ලෙස ගණනය කර තිබුණද, මූල්‍ය ප්‍රකාශන වල වත්කම් ලෙස දක්වා නොතිබුණි. | ඉදිරි මුදල් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කිරීම් කරන බව | වත්කම් ලෙස අනාවරණය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී ලැබිය යුතු මුද්දර ගාස්තු රු.11,118,150 ක් පළාත් ආදායම් බදු දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු ලෙස තහවුරු කර තිබියදී, එම වටිනාකම මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබුණි. | ඉදිරි මුදල් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කිරීම් කරන බව | ලැබිය යුතු ගාස්තු ලෙස අනාවරණය කිරීමට කටයුතු කළ යුතුය. |

**1.7 අනුකූල නොවීම්**

**1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි 571(1), (2), (3) | වර්ෂ 02 කට වැඩි කල් ඉකුත් වූ රු.562,244 ක තැන්පතු 06 ක් සම්බන්ධයෙන් සභාව අදාළ කටයුතු සිදුකර නොතිබුණි. | අදාළ අයට දැනුම් දීමට කටයුතු කරනු ලැබේ. එසේ නොවුනහොත් සභාවේ ආදායම් ලෙස ගැනීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව, කල් ඉකුත් වූ තැන්පතු සම්බන්යෙන් කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචන

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 13,776,717 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 8,091,768 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම් , රැස්කළ ආදායම් හා හිඟ ආදායම

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව සභාව විසින් ඉදිරිපත්කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කල ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිගය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කල ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිගය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 350,000 | 167,235 | 167,235 | - | 350,000 | 146,200 | 146,200 | - |
| (ii) | කුලී | 13,975,000 | 11,625,839 | 8,901,169 | 2,724,670 | 11,960,000 | 9,954,669 | 8,583,869 | 1,370,800 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,372,000 | 1,133,450 | 1,010,450 | 123,000 | 1,542,000 | 757,475 | 757,475 | - |
| (iv) | වෙනත් ආදායම් | 20,805,000 | 20,431,478 | 19,469,592 | 961,885 | 15,930,000 | 15,769,748 | 13,698,423 | 2,071,324 |
| | එකතුව | 36,502,000 | 33,358,002 | 29,548,446 | 3,809,555 | 29,782,000 | 26,628,092 | 23,185,967 | 3,442,124 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කායර්සාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| (අ) | වර්ෂ 07 කට වැඩි හිඟව පවතින බදු රු.273,300 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාළ පුද්ගලයින්ව හඳුනාගැනීමට නොහැකි බැවින් ඒවා ලියාහැරීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සභා බලප්‍රදේශය තුළ ඇති ව්‍යාපාර ආයතන 235 කට වාර්ෂික ව්‍යාපාර බලපත්‍ර සහතික ලබාදීමට කටයුතු කර නොතිබුණි. | අදාළ කාලය තුළ ව්‍යාපාර බලපත්‍ර ලබාදීමට කටයුතු කරන බව. | අදාළ අනුමැතිය ලබා දීමේ කටයුතු කඩිනම් කළ යුතුය. |
| (ඇ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2023 දෙසැම්බර් 31 ලැබිය යුතුව තිබූ මුද්දර ගාස්තු රු. 1,583,267 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මුද්දර ගාස්තු අයකර ගැනීමට කටයුතු සිදුකරන බව. | මුද්දර ගාස්තු අදාළ කාලය තුළ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාවේ කාබනික පොහොර නිෂ්පාදන මධ්‍යස්ථානය, 2022 වර්ෂයේ මාසිකව රු.667,500 කට කුලියට දීම සඳහා පෞද්ගලික ආයතනයක් සමග ගිවිසුම්ගතවී රු.3,000,000 ක් අත්තිකකාරම් ලෙස ලැබී තිබුණ නමුත්, අදාල කාලය තුළ සභාවට කිසිඳු කුලියක් සහ විදුලි ගාස්තුවක් ආයතනය විසින් ගෙවා නොතිබුණි. | හිඟ ගෙවන ලෙස දැනුම් දී ඇත. මෙයට අතිරේකව අදාල ආයතනයට විරුද්ධව නීතිමය ක්‍රියාමාර්ගද ගෙන තිබෙන බව. | මාසිකව නිසි අයුරින් ආදායම අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සභාවට අයත් සහ උපයෝජනය කරන ඉඩම් හා ගොඩනැගිලි 33 ක් ප්‍රත්‍යාගණනය කර එහි සත්‍ය වටිනාකම මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබුණි. | ඉඩම් ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය කර මූල්‍ය ප්‍රකාශන වල දැක්වීමට කටයුතු කරන බව. | ප්‍රත්‍යාගණනය කර ගිණුම් නිවරදි කිරීමට කටයුතු කළ යුතුය. |

### 3.2 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභවට අයත් දීර්ග කාලයක් අබලන්ව පවතින වාහන 10 ක් අලුත්වැඩියා කර නැවත උපයෝජනයට ගැනීමට හෝ අපහරණය කිරීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි. | අලුත්වැඩියා කිරීමටත්, අනෙකුත් වාහන වෙන්දේසියේ විකිණීමටත් කටයුතු සිදුකරමින් පවතින බව. | දේපළ කළමනාකරණ චක්‍රලේඛ අංක 05/2020 ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ අවසානයට ප්‍රතිලාභීන් 266 ක් විසින් ජල සම්බන්ධතා ලබාගැනීමට හානි සිදුකරන ලද මාර්ග ප්‍රතිසංස්කරණය සඳහා රු. 556,000 ක් තැන්පතු ලෙස අයකර තිබුණද, එම මාර්ග ප්‍රතිසංස්කරණය කරගෙන තැන්පතු මුදල ආපසු ලබාදීමට හෝ එම මුදලින් සභාව විසින් ප්‍රතිසංස්කරණය කිරීමට හෝ කටයුතු කර නොතිබුණි. | වැඩ අවසන් කළ මාර්ග සඳහා තැන්පතු මුදල් නැවත ලබාදීමට සහ නැවත ලබානොගත් තැන්පතු මුදල් ආදායම් ලෙස මාරු කිරීමට කටයුතු කරන බව. | ප්‍රතිසංස්කරණය සඳහා අවශ්‍ය කටයුතු කඩිනම් කළ යුතුය. |
| (ඇ) | වෙනත් ආයතනවලින් පරිත්‍යාග ලෙස ලැබී තිබුණු වාහන 07 ක අයිතිය සභාවේ නමට පවරා ගැනිමට කටයුතු කර නොතිබුණි. | වාහන වලට අදාල සැලැකියයුතු රේගු ගාස්තු නිසා අයිතිය මාරුකිරීමේදී ප්‍රමාද සිදු වී තිබුණ බව. | අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | සභාවට අයත් සහ සභාව විසින් උපයෝජනය කරමින් පවතින වාහන 31 ක වටිනාකම ප්‍රත්‍යාගණනය කර එහි සත්‍ය වටිනාකම මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබුණි. | වටිනාකම් ප්‍රත්‍යාගණනය කර මූල්‍ය ප්‍රකාශන වල දැක්වීමට කටයුතු කරන බව. | ප්‍රත්‍යාගණනය කර ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 පාරිසරික ගැටලු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1988 අංක 56 සහ 2000 අංක 53 දරන පනත් වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික සහ ඒ යටතේ ක්‍රියාත්මක රෙගුලාසිවලට අනුකූලව බලපත්‍ර ලබාගැනීම සඳහා ලියාපදිංචි වී ඇති කර්මාන්ත ආයතන 130 ක් සමාලෝචිත වර්ෂයේ අලුත්කර නොතිබුණි. | තවද ක්‍රමාණුකූල කිරීමට සහ යාවත්කාලීන කරීමට කටයුතු කර ඇති බව. | අදාල පනත් ප්‍රකාරව, බලපත්‍ර අලුත් කිරිමට කටයුතු කළ යුතුය. |

.

### 4.2 අපේක්ෂිත නිමවුම් මට්ටම් ලබා නොගැනිම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දේශීය සංවර්ධන ආධාර ව්‍යාපෘති වැඩසටහන යටතේ තිරායිකේණි පෙර පාසල සඳහා වූ ගොඩනැගිළි අළුත්වැඩියා වැඩ කටයුතු, භූමිය පිරවීම, වට බැම්ම බැදීම, ළමා උයන ක්‍රීඩා උපකරණ සහ ශිෂ්‍යයින්, ගුරුවරුන් සඳහා වන ලී බඩු මිල දී ගැනීම යනාදිය සඳහා 2022 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා රු. 5,281,850 වියදම් කර තිබුණද, ඒවා සම්පූර්ණ කර සිසුන්ගේ අධ්‍යාපන කටයුතුවල යෙදවීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි. | සම්පූර්ණයෙන් නිමකර උපයෝජනයට ගැනීම සඳහා වැඩ LDSP මූල්‍ය සැලැසුම් යටතෙ සම්පූර්ණ කිරීමට කටයුතු සිදුකරමින් පවතින බව. | අදාල අළුත්වැඩියා කටයුතු සම්පූර්ණ කර නිසි අරමුණු ළඟාකර ගැනිම කඩිනම් කිරීමට කටයුතු කළ යුතුය. |